# 多言語情報コーナー　　　　　　　　　（令和６年　９月号）

## <u>1. භූමිකම්පාවක් සඳහා ඔබගේ සූදානම පරීක්ෂා කිරීම සඳහා</u>

අගෝස්තු මස 8 වැනි දින මියගි ප්‍රාන්තයේ සිදුවූ 7.1 ක විශාලත්වයෙන් යුතු භූ කම්පනය හේතුවෙන් රික්ටර් මාපකයේ 6 ක කම්පනයක් නිරීක්ෂණය වූ අතර, ජපානයේ කාලගුණ විද්‍යා ඒජන්සිය නිවේදනය කළේ නන්කයි තොරබු භූ කම්පනයට හේතුවෙන් ඉදිරියේදී විශාල ප්‍රමාණයේ භූමිකම්පාවක් ඇතිවීමේ සම්භාවිතාව වෙනදාට වඩා වැඩි වන අතර එවැනි විශාල ප්‍රමාණයේ භූමිකම්පාවකට සූදානම් වීමේ අවශ්‍යතාවය  සඳහන් කරයි.

නන්කයි තොරබු යනු ෂිෂෝකා ප්‍රාන්තයේ සිට මියාසකි ප්‍රාන්තය දක්වා වූ සාගර පත්ලේ පිහිටි ප්‍රදේශයක් වන අතර එය ජපන් දූපත් සමූහයේ ගොඩබිම් පැත්තේ පිහිටි භූ තැටිය සහ සාගරය හා සම්බන්ද භූ තැටිය සම්බන්ද වන ගැඹුරු ප්‍රදේශයක් වන අතර එම භූ තැටිවල සිදුවන වෙනස්වීම මත විශාල ප්‍රමාණයේ භූමිකම්පාවක් සිදු වේ.

නන්කයි තොරබු ප්‍රදේශයේ තොරතුරු වලට අනුව වසර 100 සිට 150 දක්වා කාල පරාසයන් තුල මැග්නිටියුඩ් 8 ප්‍රමාණයේ විශාලත්වයකින් යුත් භූ කම්පන නැවත නැවතත් සිදු වන බව අනුමාන කෙරේ.
රජයේ භූ කම්පන පර්යේෂණ ආයතනයට අනුව මැග්නිටියුඩ් 8ත් 9ත් අතර ප්‍රමාණයේ දැවැන්ත භූමිකම්පාවක් ඉදිරි වසර 30 තුල ඇතිවීමේ සම්භාවිතාව 70%ත් 80%ත් වන බව අනුමාන කෙරේ.

නන්කයි තොරබු නමින් හඳුන්වන භූමිකම්පාව, කන්තෝ ප්‍රදේශයේ සිට ඔකිනාවා ප්‍රදේශය දක්වා වූ ප්‍රදේශ වල භූ කම්පන තීව්‍රතාවය 6කින් යුතු දරුණු සෙලවීමක් සහ මීටර් 3ක් හෝ ඊට වැඩි උසකින් යුත් සුනාමියක් ඇතිවීමේ අවදානමක් ඇත. .

ඉහත සඳහන් නන්කයි තොරබු නමින් හඳුන්වන භූමිකම්පාව මගින් තොචිගි ප්‍රාන්තයට විශාල හානියක් සිදුවීමේ හැකියාව අඩු බව පැවසේ, නමුත් සෑම දිනකම භූමිකම්පා මගින් සිදුවිය හැකි අනතුරු වලක්වා ගැනීමට සූදානම් වෙමු.

‘‘දෛනික සූදානම් කිරීම්’’වලට ගෘහ භාණ්ඩ සවි කිරීම, ඉවත් කිරීමේ ස්ථාන සහ මාර්ග පරීක්ෂා කිරීම, ජලය සහ ඔබේ පවුලේ අය සමඟ සන්නිවේදනය කරන ආකාරය වැනි දේවල් පිලිබඳව පෙර සූදානම් වීම වැදගත් වේ.

## 2. ගැලපුම් ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳ

අවධමනය සම්පූර්ණයෙන් මිදීම වෙනුවෙන් විස්තීරණ ආර්ථික වැඩපිළිවලක් තුල භාණ්ඩවල මිලගණන් ඉහළයාමට සහයෝගයක් වෙනුවෙන් කොටසක් ලෙස බදු ගෙවන්නන් ඇතුළුව යැපෙන්නන්,සහකරුවන් යන එක් එක් පුද්ගලයන් වෙනුවෙන් යෙන් හතලිස් දහසක් (40,000)වන ලෙසද එය 2024 අදායම් බද්දෙන් යෙන් තිස් දහසක්ද (30,000)නගර බද්දෙන් යෙන් දස දහසක් (10,000)බැගින් ස්ථාවර බදු අඩුකිරීමක් සිදුකරනු ලැබේ.

එම අවස්ථාවේ දී, ස්ථාවර බදු අඩු කිරීම සම්පූර්ණයෙන් ලබා ගැනීමට නොහැකි වනු ඇතැයි අපේක්ෂා කරන අය සඳහා, බදු මගින් අඩු කළ නොහැකි මුදල ආසන්නතම යෙන් 10,000 දක්වා ගණනය කිරීමෙන් ස්ථාවර මුදල අඩු කරනු ලැබේ.

2024 ජනවාරි 1 වන දිනට, ලිපිනය තොචිගි නගරයේ ලියාපදිංචි ඇති ආදායම් බද්ද හෝ පුද්ගල බදු එක්වරක් හෝ ගෙවා ඇති ස්ථාවර බදු ගෙවීම් ප්‍රමාණවත් නොවන යද මේ සඳහා අදලවනුබව අපේක්ෂා කෙරේ.
තොචිගි නගර කාර්යාලය විසින් සුදුසුකම් ලත් පුද්ගලයින්ට ''ගැළපුම් ප්‍රතිලාභ'' ලබා දෙනු ඇත, එය අගෝස්තු මස මුලදී පැමිණෙන පරිදි තහවුරු කිරීමේ ලිපිය තැපැල් කර ඇත.

ප්‍රතිලාභ ලබා ගැනීමේදී අවශ්‍ය ලේඛන ඉදිරිපත්කලයුතු වේ. ඔබට නගර කාර්යාලය විසින් එවන ලද ගෙවීම් තහවුරු කිරීමේ ලිපිය ලැබුණු විට, කරුණාකර අන්තර්ගතය පරීක්ෂා කර අවශ්‍ය තොරතුරු පුරවන්න.ඔබගේ අනන්‍යතාවය තහවුරු කරන ලියවිල්ලක් සමග සම්පූර්ණකරන ලද අයදුම් පත අදාල ලියුම් කවරයට දමා නැවත තොචිගි නගර කාර්යාලය වෙත එවන්න.
**අයදුම් කිරීමේ කාලය 2024 ඔක්තෝබර් 31 දක්වා වේ.**

සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන පුද්ගලයෙකුට තවමත් තහවුරු කිරීමේ ලිපිය ලැබී නොමැති නම්, තොචිගි නගරයේ තාවකාලික ප්‍රතිලාභ ඒකකය වන දුරකථන අංකය **0282-25-5211** වෙත දැනුම් දෙන්න.
එම අවස්ථාවේදී, කරුණාකර ඔබගේ උපන් දිනය සහ නම ලබාදීමට සිදුවන අතර දීමනාව ලබා ගැනීම සඳහා කොන්දේසිය වන්නේ ඔබ ඔබේ බදු ගෙවා ඇති බවයි.

## 3. ඌසුමා ඇල අශ්‍රිතව පැවැත්වෙන අන්දොන් උත්සවය පිලිබදව

තොචිගි නගරයේ සංකේතය වන ඌසුමා ඇල නගරය මැදින් ගලා බසින, ඉතා අලංකාරවත් ගිම්හාන රාත්‍රියක් නිර්මාණය කරන උත්සවය 11වන වරට වර්ණවත් ආලෝකයන් සමඟ පැවැත්වේ.

කයිඋන්බසි සිට ඌසුමා උද්‍යානය දක්වා, තොචිගි නගරයේ හි කඩදාසි කැපීමේ කලාකරුවෙකු වන කවසිමා මසසිමා මහතා විසින් නිර්මාණය කරන ලද දෝලාවන් සහ පාවෙන වැනි කඩදාසි දජ 123 ක් ඒවා මත අලවා ඇත ගිම්හාන සන්ධ්‍යාවට අපූරු වර්ණයක් ගෙනදෙයි.

සැප්තැම්බර් 30 දක්වා රාත්‍රී 7 සිට රාත්‍රී 10 දක්වා පහන් දැල්වෙනු ඇත අතර අන්දොන් මගින් ආලෝකමත් කරන ලද ආලෝකය විදිමින් ගංගා සඳළුතලය දිගේ විවේකීව ඇවිදින්න.

අන්දොන් සවි කර ඇති ස්ථානය පාරට මුහුණලා ඇති බැවින් වාහන ගමන් කිරීමට ප්‍රමාණවත් ඉඩක් ඇති බව කරුණාවෙන් සලකන්න